**පද්මපාණි බෝධිසත්ව රූපය**



- අජන්තා ලෙන් පන්තියේ අංක 1 වන ලෙනෙහි පද්මපාණි බෝධිසත්ව රූපයය දැක ගත හැකි ය.
- බෝධිසත්ත්ව රූපය ත්‍රිභංග ඉරියව්වෙන් යුක්ත ය.
- දකුණතින් මහනෙල් මලක් දරා සිටී.
- මුහුණේ මද සිනහව ආධ්‍යාත්මක ගුණයෙන් පිරිපුන් කරුණාව මැනවින් දක්වා ඇත.
- අලංකාර රංග වස්ත්‍රාභරණ මගින් රාජකුමාරයෙකුගේ ශෝභා සම්පන්න බව මතු කරයි.
- ප්‍රධාන රූපය වන පද්මපානී බෝධිසත්ත්ව රූපය දීප්තිමත් කහ පාටින් මතුකර දක්වා සෙසු චරිත හා හැඩ අඳුරු වර්ණ සහිත පසුබිමකින් චිත්‍රණය කර ඇත .
- ගුප්ත සම්ප්‍රදායට අයත් කලා ලක්ෂණ සහිත ය.
- වියළි බදාමය මත සිතුවම් නිර්මාණය කර ඇත.

**<u>බුදුන් වහන්සේ කිඹුල්වත් පුරයට වැඩම කිරීම.</u>**



- ඉන්දියාවේ අජන්තා ලෙන් පන්තියේ අංක 17 වන ලෙනෙහි ඇති සිතුවමයි
- බුදුන් වහන්සේගේ රුව විශාල වත් අවශේෂ රූප කුඩාවටත් දක්වා බුදුන් වහන්සේගේ උත්තරීතර බව පෙන්නුම් කිරීමට උත්සාහ දරා ඇත
- පර්යාවලෝක ලක්ෂණ සහිත ව නිර්මාණය වූ සිතුවමකි
- නෙළුම් මලක් මත වැඩ සිටින බුදුන් වහන්සේගේ හිසට ඉහළින් ඡත්‍රයක් දරා සිටින දේව රූපයක් ද චිත්‍රණය කර ඇත
- කිඹුල්වත්පුරයට පිඩු සිඟා වඩින බුදුරජාණන් වහන්සේ දැක මාලිගයේ සිටි යසෝදරා දේවිය රාහුල කුමරුන්ට ඔහුගේ පියාණන් හඳුන්වාදෙන අවස්ථාව සිතුවමින් නිරූපණය වේ.
- ගුප්ත කලා සම්ප්‍රදායට අයත්ය
- වියළි බදාමය මත ඇඳ ඇත
- ආගමික භක්තියත් බුද්ධාලම්භන ප්‍රීතියත් ඇතිවන ආකාරයට රූප සම්පිණ්ඩනය කර ඇත

ප්‍රශ්න

- මෙම සිතුවම දැකගත හැක්කේ කොහේදිද ?
- පද්මපාණී බෝසත් රුව ඇති ගුහාවත් කිඹුල්වත් පුර වැඩම කිරීම සිතුවම් ඇති ගුහා නම් කරන්න
- කිඹුල්වත් පුර වැඩීම සිතුවමේ බුදුන් වහන්සේ විශාල කර දක්වා ඇත්තේ කුමන හේතුවක් නිසාද?
- මෙම සිතුවම් වලට ඉන්දීය කුමන කලා ලක්ෂණ බලපා ඇත්ද ?
- මෙම සිතුවම් දෙකෙ හි වර්ණ භාවිතය ගැන කෙටි හැඳින්වීමක් කරන්න
- මෙම සිතුවම් දෙකෙහි හැඟීම් ප්‍රකාශනය ගැන වාක්‍ය බැගින් ලියන්න